**නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම් කරණ මූල ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ බැංකු ගිණුම් 04 ක 2018 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව බැංකු ශේෂවල එකතුව රු.26,132,554 ක් විය. මූල්‍ය ප්‍රකාශනවල එම දිනට බැංකු ශේෂවල එකතුව රු.26,988,085 ක් ලෙස දැක්වීම නිසා බැංකු ශේෂය රු.855,531 කින් වැඩියෙන් දක්වා තිබුණි. මෙම වටිනාකම හඳුනාගෙන ගැලපුම් කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | වෙනස්වීම් සඳහා හේතු හඳුනාගෙන ගිණුම් ශේෂ ඉදිරි වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කළ යුතු අතර තවදුරටත් වෙනස්කම් පවතනින බැංකු ගිණුම් දෙක පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. | අප සභාවේ පොදු සහ පරිත්‍යාග ගිණුම්වල ශේෂ පිරික්සුමේ දැක්වෙන ශේෂය සහ සත්‍ය ශේෂය අතර පසුගිය වර්ෂ 10 ක කාලය තුළ සමාන ප්‍රමාණයන්ගෙන් වෙනස්කම් පැවතුණි. බැංකු ශේෂ වැඩි වී තිබීමට හේතුව පසුගිය මූල්‍ය වර්ෂයේ සිදු වූ දෝෂය නිවැරදි නොකිරීම වී තිබුණි. |
| (ii) | සේවක ණය ලේඛනය අනුව, සේවක ණය ශේෂය රු.15,719,724 ක් විය. මූල්‍ය ප්‍රකාශනවල මෙම සේවක ණය ශේෂය රු.17,634,837 ක් විය. මේ අනුව, සේවක ණය ශේෂය රු.1,915,113 කින් වැඩි වී තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිපුර අවධානය යොමු කර වෙනස සොයා ගැලපීම් කළ යුතු වේ. | සේවක ණය ශේෂය, මුල් කාලයේදී සේවක ණය ණය ලේඛනයේ සිදු වූ දෝෂයක් හේතුවෙන් අඛණ්ඩව මෙම ශේෂය වෙනස් වී පැවතුණි. එසේ වුවත්, විගණන විමසුම් ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටුව විසින් ලබා දුන් දැනුවත් කිරීමට අනුව, |

| | | | |
|---|---|---|---|
| | | | අප විසින් ඇතැම් අඩුපාඩු ගැලපීම් සිදු කර ඇති අතර අනෙකුත් කාරණා ගැලපීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතී. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම්වල දැක්විය යුතු විවිධ වියදම්, මූලධන වියදම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. | දෝෂ සහිත ආකාරයෙන් වර්ගීකරණය කළ විෂයය ගැලපීමට කටයුතු කළ යුතු අතර ඉදිරි වර්ෂවලදී නිවැරදි ආකාරයෙන් වර්ගීකරණය කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් යටතේ දැක්විය යුතු විවිධ වියදම් වැරදීමකින් මූලධන වියදම් ලෙස දක්වා තිබුණි. එය නිවැරදි කර ඇත. |
| (iv) | විවිධ තැන්පත් ලෙජරය අනුව, ශේෂය රු.19,911,832 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ශේෂය රු.20,026,009 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා විවිධ තැන්පතු ශේෂය රු.114,177 කින් වැඩියෙන් දක්වා ඇත. | වෙනස්කම් සොයා බලා ඉදිරියේදී නිවැරදි කළ යුතු වේ. | පසුගිය වර්ෂවල විවිධ තැන්පතු ශේෂවල සිදු වූ වැරදි හේතුවෙන් රු.15,097.84 ක් වැඩියෙන් දක්නට ලැබුණි. විවිධ තැන්පතු ශේෂවලින් තවත් රු.99,078.70 ක් දැන් ගැලපීම් සිදු කොට මේ සමඟ එකතු කර ඇත. |

### 1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| වරිපනම් හා බදු | රු. 12,454,562 | කාල විශ්ලේෂණය | කාල විශ්ලේෂණය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | කාල විශ්ලේෂණය කඩිනමින් ඉදිරිපත් කරනු ලබන බව දැනුම් දෙමි. |

### 1.4 අනුකූල නොවීම

**නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 සිට 05 කට අධික රු.12,498,998 ක් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ සහ | 2012 වර්ෂයට පෙර වූ විවිධ ටෙන්ඩර් තැන්පතු |

| | | | | |
|---|---|---|---|---|
| | | ටෙන්ඩර් විවිධ හා කොන්ත්‍රාත් තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | යුතු වීම. | 2018.07.10 දින පැවති මාසික සභා රැස්වීමේදී තීරණ අංක 6(ඉ) 2018.07.16 දින වවුචර් අංක XE 40715 යටතේ රු.1,630,566.29 ක් ආදායම් ගිණුමට මාරු කර තිබුණි. අනෙකුත් තැන්පතු ද මාරු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ x පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමග සසඳා විචල්නයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීම් සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | මෙම ප්‍රකාශය සකස් කර ඉක්මනින් ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 47,913,097 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,272,975 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 26,420 | 24,855 | 23,341 | 821 | 26,404 | 22,479 | 26,058 | 12,454 |
| බලපත්‍ර ගාස්තු | 4,523 | 2,153 | 2,361 | 208 | 4,028 | 6,351 | 2,271 | 99 |

පසුගිය වර්ෂයේ බලපත්‍ර ගාස්තු ආදායම් රු.6,351,000 ක් වුවත්,සමාලෝචිත වර්ෂයේ එය රු.2,153,000 ක් විය. තවද, සමාලෝචිත වර්ෂයේ අයකර ගත යුතු හිඟ බලපත්‍ර ගාස්තු වටිනාකම පසුගිය වර්ෂයේ හිඟ මුදලට වඩා රු.109,000 කින් වැඩි වී තිබුණි. මෙය බලපත්‍ර ගාස්තු අයකිරීමේ මන්දගාමී තත්ත්වය නිරූපනය කරයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අඩු බර ළදරුවන්ගෙන් උපත් අනුපාතය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින ප්‍රදේශවල ඉපදුනු ළදරුවන්ගෙන් අඩු බරකින් යුතුව ඉපදුනු ළදරුවන්ගේ අනුපාතය 2015, 2016, 2017 සහ 2018 වර්ෂවලදී පිළිවෙලින් 9.47%, 12.1% ක්, 14.7% ක් සහ 11.3% ක් විය. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවැය ඇස්තමේන්තුව මඟින් මාතෘ ළදරු සුභසාධනය සහ ළමා ආරක්ෂාව සඳහා කිසිඳු ආකාරයක වියදම් ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. මේ නිසා, සභාව විසින් මාතෘ ළදරු සුභසාධනය කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි. | මාතෘ ළදරු සුභසාධනය සහ ළමා ආරක්ෂාව සඳහා අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | පසුගිය වර්ෂ 10 ක් තිස්සේ අපගේ සුභසාධන සේවාවන් සඳහා වූ වැඩසටහන්වලින් අඩු බර ළදරු උපත් ප්‍රතිශත මෙහෙයුම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු බව පිළිගනිමු. එසේ වුවත්, දැන් 2019 වර්ෂයේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක් වී ළමා ආරක්ෂාව අඩු බර ළදරුවන්ගේ උපත් අනුපාතය අඩු කිරීමේ කටයුතු කෙරීගෙන යන අතර 2020 වර්ෂයේ සිට අපගේ අයවැය ඇස්තමේන්තුවේ මේ සඳහා ප්‍රතිපාදන සලසා ගනු ලබන බව දැනුම් දෙමි. |

#### (ආ) තිරසාර සංවර්ධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව එහි අරමුණු හා ඉලක්ක සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, 2030 වර්ෂයේ ළඟා කරගත යුතු තිරසාර සංවර්ධන පිළිබඳව ප්‍රමාණවත් | තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩසටහන් සකස් කර එය ක්‍රියාත්මක කළ යුතුය. | පළාත් පාලන කොමසාරිස්වරයා සහ ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පළාත් පාලන සභාපතිවරුන්, ලේකම්වරුන්, නිලධාරීන්ට මේ පිළිබඳව වැඩමුළුවක් |

| | | | |
|---|---|---|---|
| | දැනුවත්භාවයක් ලබාගෙන නොතිබුණි. | | 2018.09.18 දින පවත්වා තිබුණු බව ඔබට කාරුණිකව දැනුම් දෙමි. මෙම දැනුවත් කිරීමට අනුව ක්‍රියාකිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධ පුහුණුවීම් මගින් සභාවේ සභිකයන්ට, නිලධාරීන්ට දැනුම ලබාදෙන බවට දන්වා සිටිමි. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ තොග සමීක්ෂණයේදී සභාව විසින් නඩත්තු කරනු ලබන සාම්බලතිවු සහ උප්පුවෙලි පුස්තකාලවල පිළිවෙලින් පොත් 1902 ක් සහ 636 ක් අතුරුදහන් වී තිබූ බව අනාවරණය කළ ද, ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි. | පොත් ඌනතාවය ගැන සොයා බලා කටයුතු කළ යුතු වේ. | අප සභාවේ ඇති පුස්තකාල 04 සඳහා පුස්තකාලයාධිපති සඳහා අනුමත සේවක සංඛ්‍යාව 04 කි. එසේ වුවත්, පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු පමණක් රාජකාරී කරති. උප්පුවෙලි සහ සාම්බල්තිවු මහජන පුස්තකාලවල පොත් 2,538 ක් අතුරුදහන් වීම පිළිබඳව මෙම පුස්තකාලයාධිපති දෙදෙනා ලවා දැනට කටයුතු කරනු ලබන බව දැනුම් දෙමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ බර ඒසවීමේ යන්ත්‍ර පැවතුණද, මේවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව සම්පත් අවශ්‍ය වුවත්, මෙම පුරප්පාඩු පිරවීම සඳහා නියමිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මානව සම්පත් පුරප්පාඩු පිරවීම සඳහා වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතු වේ | බර ඒසවීමේ යන්ත්‍ර ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ලිපි යවා ඇති අතර දැනට වැඩ බලන පදනම මත බර ඒසවීමේ යන්ත්‍ර ක්‍රියාකිරීමේ රියදුරෙක් ලවා බර ඒසවීමේ යන්ත්‍ර ක්‍රියා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණ සහකාර පුරප්පාඩු සමාලෝචිත වර්ෂයේ 02 ක් වුවත්, මේ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් පුරප්පාඩු පිරවීම සඳහා වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතුයි. | කළමනාකරණ සහකාර පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අපගේ අංක TG/PS/EST/New Cadre/2017, 2018.05.30 දිනැති ලිපිය යවා ඇති (ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.) එසේම, TG/PS/EST/cadre/2018 2019.01.14 දිනැති දිනවලදී ලිපිය මඟින් නව සේවක බඳවා ගැනීම සඳහා යවා ඇත. මෙයට අනුකූලව සහකාර ප්‍රධාන ලේකම්වරයා විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. |
| (ඇ) | සෞඛ්‍ය සුපරීක්ෂක තනතුර පුරප්පාඩු වී තිබූ නමුත් මේවා පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මානව සම්පත් පුරප්පාඩු පිරවීම සඳහා වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සෞඛ්‍ය සුපරීක්ෂක තනතුර පිරවීම සඳහා අපගේ TG/PS/EST/New Cadre/2017, **2018**.05.30 දිනැති ලිපිය යවා ඇත. ( ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.) එසේම, අංක TG/PS/EST/cadre/2018 දරන 2019.01.14 දිනැති ලිපියේ නව සේවක තනතුරු ඇති කිරීම සඳහා ඉල්ලීම් යවා ඇත. මෙයට අනුකූලව සහකාර ප්‍රධාන ලේකම්වරයා විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**-------------------------------**

**3.4.1 වත්කම් ලේඛනගත කිරීම**

**----------------------------**

| විගණන නිරීක්ෂණය<br>--------------------------- | නිර්දේශය<br>----------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>----------------------- |
|---|---|---|
| අනෙකුත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලබාගෙන තිබූ වාහන 08 ක් වර්ෂ 12 කට අධික කාලයක සිට භාවිතා කරමින් පැවතුණද ඒවා සභාවේ නමට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ කරුණ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කොට වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතුයි. | අප සභාවට අනෙකුත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 18 ක් අපගේ වත්කම් ලේඛනයේ ලේඛනගත කර ඇත. ඉන් වාහන 10 ක ලියාපදිංචි පොත් අප සභාවේ නමට පවරා ගැනීම් සිදු කොට ඇත. අනෙකුත් වාහන 08 සඳහා සභාවේ නමට පවරා ගැනීමේ කටයුතු සඳහා අංක TC/TGPS/WD/V.Co දරන 2017.08.03 දිනැති ලිපිය මඟින් මෙම වාහන සඳහා ලියාපදිංචි පොත් අපගේ |

| | | |
|---|---|---|
| | | නමට මාරු කර දෙන මෙන් සිදු කළ ඉල්ලීම අනුව ප්‍රධාන ලේකම්වරයාගේ අංක EP/01/1/VH/005 දරන 2017.08.14 දිනැති ලිපිය සහ අංක EP/01/01/VH/005 දරන 2017.06.07 දිනැති ලිපි මඟින් නැගෙනහිර පළාත් සභාවේ පරිපාලන සම්බන්ධ කාර්යාලවලින් භාවිතා කරනු ලබන සියළු වාහනවල ලියාපදිංචි නම "ප්‍රධාන ලේකම් - නැගෙනහිර පළාත් සභාව" යන නමින් පැවැතිය යුතු බව සඳහන් වීම නිසා සභාවේ නමට මාරු කර නොතිබුණි. |

**3.4.2 නිෂ්කාර්යව පවතින වත්කම්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------------ | --------------------- |
| (අ) | පුර නැඟුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේදී ඉදිකළ කඩ කාමර 16 කින් යුතු කඩ කාමර සංකීර්ණයක කඩ කාමර 03 ක් 2014 වර්ෂයේ සිට මේ දක්වා කුලියට ලබා දී ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර සංකීර්ණය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා සභාව කටයුතු කළ යුතු වේ. | කඩ කාමර 16 ක් සඳහා ලංසු කැඳවා තිබූ නමුත්, දැනට කඩ කාමර 11 ක් කුලියට ලබා දී ඇත. අනෙකුත් කඩ කාමර 03 කිසිවෙකුත් ඉල්ලීම් නොකර නොගත් නිසා මෙම කඩ කාමර භාවිතා කර නොතිබුණි. මේ නිසා ඉදිරි කාලයේදී සියලුම කඩ කාමර භාවිතා කරනු ලබන බව ඔබට දැනුම් දෙමි. |
| (ආ) | සභා ප්‍රතිපාදන යටතේ සාම්බල් තිවු සංස්කෘතික මධ්‍යස්ථානය 2015 අගෝස්තු 31 දින රු.900,305 ක වියදමින් අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවත්, මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා ජලය සහ විදුලිය පහසුකම් සලසා ගෙන නොමැති වීම නිසා විගණන දිනය වන 2019 මැයි 21 දින වන විටත් මෙම ගොඩනැගිල්ල අදාළ අරමුණ සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ඔබගේ වැඩිදුර ක්‍රියාමාර්ග අපට දැනුම් දීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ප්‍රතිපාදන යටතේ ඉදිකළ සාම්බල්තිවු සංස්කෘතික මධ්‍යස්ථානය පිටස්තර පුද්ගලයන්ට කුලියට ලබාදෙන මෙන් ඉල්ලීම් නොකළ බැවින් හා සාම්බල්තිවු පුස්තකාලයේ වහලය කැඩී ඇති බැවින් වර්ෂා දිනවල වැසි ජලය කාන්දු වීම් සිදුවන නිසා සංස්කෘතික මධ්‍යස්ථානය සාම්බල්තිවු පුස්තකාලය බවට පත්කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. තවත් මාසයක කාලයක් තුළ සංස්කෘතික මධ්‍යස්ථානය සාම්බල්තිවු සංස්කෘතික මධ්‍යස්ථානය පුස්තකාලයක් ලෙස භාවිතා කරනු ලබන බවට ඔබට දන්වා සිටිමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | බහු කාර්ය ශාලාව ඉදිකිරීම සහා ප්‍රතිපාදන යටතේ බහු කාර්ය ශාලාව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු.5,464,591 ක වටිනාකමක් මත 2017 ජුනි 14 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | කොන්ත්‍රාත් වටිනාකම වන රු.5,464,591 ක් හා සභාවේ තක්සේරු වටිනාකම වූ රු.6,647,822 අතර 17.79% වෙනසක් නිරූපනය වූයෙන්, කාර්යසාධන ඇපකරය ලබාගැනීමේදී, කොන්ත්‍රාත් වටිනාකමෙන් 10% ක් හෙවත් රු.546,459 ක් අයකළ යුතු බව තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහන් කර තිබුණි. එසේ වුවත්, සභාව විසින් රු.273,230 ක් පමණක් අයකර ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයට තවදුරටත් අයකළ යුතු ඉතිරි 5% වූ රු.273,230 ක් අයකර නොගැනීම හේතුවෙන් සභාවට එම වටිනාකම අහිමි වී තිබුණි. | කොන්ත්‍රාත් පිරිනැමීමේදී දෝෂ සිදු නොවන අයුරින් ලේඛන සකස් කර අයකිරීම් නිවැරදිව සිදු කළ යුතුය. තවද, සභාවට පාඩු සිදුවන අවස්ථාවලදී ඒ පිළිබඳ පරීක්ෂා කොට පාඩුවට වගකිව යුතු | තාක්ෂණික ඇගයීම් වාර්තාව ප්‍රකාරව, ඉහත කර්මාන්තය සඳහා කාර්යසාධන ඇපකරය කොන්ත්‍රාත් වටිනාකමෙන් 10% ක් ලබා ගත යුතු බව සඳහන්ව ඇත. එසේ වුවත්, ගිවිසුම් ලේඛනවල ආකාරයට 5% ක කාර්යසාධන ඇපකරය ලබා ගත යුතු බව සඳහන් වූ බැවින් දෝෂ සහිතව කොන්ත්‍රාත් වටිනාකමෙන් 5% ක් කාර්යසාධන ඇපකරය ලබාගෙන තිබුණි. මෙය ගැලපීම සඳහා දැනට ගෙවිය යුතු ගෙවීම්වලින් වැඩිපුර 5% ක ඇපකර අයකරගෙන සභාවේ ගිණුම්වල තැන්පත් කිරීම සඳහා ඒ වන විටත් කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. එසේ වුවත්, කොන්ත්‍රාත් අතරමඟ නැවැත්වීම පිළිබඳ තීරණය ගෙන ඇති බැවින් ගෙවිය යුතුව තිබූ ඉතිරි මුදල් තවදුරටත් නොගෙවා සම්පූර්ණයෙන්ම තැන්පත් කර ඇත. එබැවින්, ගෙවීම්වලින් අඩු කිරීමට තීරණය කළ ඉතිරි සියයට 5% ක Performance bond තැන්පත් නොකර ඉතිරි කොටස් ගෙවීම් මුළුමනින්ම කර ඇති බව දැනුම් දෙමි. එබැවින්, සභාවට පාඩුවක් වී නොමැති බව සඳහන් කරමි. |
| (ii) | මෙම වැඩ කොන්ත්‍රාත්තුව ප්‍රකාරව, 2017 නොවැම්බර් 28 දින කොන්ත්‍රාත්කරු විසින් නිම කර සභාවට භාර දිය යුතුය. එසේ වුවත්, විගණන | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු වේ. | ඉහත කාර්යය අදාළ කාලය තුළ නිම නොකිරීම මත සභාවේ අනුමැතිය සහිතව කොන්ත්‍රාත්තුව අතරමඟ නැවැත්වීමට කටයුතු කර පසු විපරම් |

දිනය වන 2019 මැයි 21 දින වන විටත් ටයිල් ඇතිරීම, නාන කාමර වැඩ, ජල සම්බන්ධතා ලබාගැනීම වැනි 50% ක් හෙවත් රු.3,018,276 ක් වටිනා කාර්යයන් නිම නොකර තිබූ නමුත් සභාව මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. 2019.05.17 දින පෙ.ව.10.30 ට පමණ පළාත් පාලන කොමසාරිස්වරයාගේ කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී මෙම කාර්යය පිළිබඳ සාකච්ඡාවට ගත් මොහොතේ කොන්ත්‍රාත්කරු මෙම කාර්යය සතියක් තුළ ආරම්භ කරන ලද බවත්, එසේම මාසයක කාලයක් ඇතුළත නිම කරදෙන බවත් පිළිගත්තේය. මෙයට අනුව, මෙම කොන්ත්‍රාත්කරු ලවා කාර්යය සම්පූර්ණයෙන් ඉටු කරවා ගැනීමට සියළු දෙනා විසින් පිළිගෙන තීරණය කර තිබුණි.

**(ආ) ගෘහස්ථ ක්‍රීඩා පිටිය ඉදිකිරීම**

**-------------------------------------**

පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ ගෘහස්ත ක්‍රීඩා පිටිය ඉදිකිරීම සඳහා රු.3,862,000 ක වටිනාකමට 2017 නොවැම්බර් 06 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇස්තමේන්තුව ප්‍රකාරව කාර්යයන් අවසන් නොකර ගොඩනැගිල්ලේ වෙනස්කම් සිදු කිරීම නිසා රු.517,482 ක් වටිනා ඇතැම් කාර්යයන් ඇස්තමේන්තුවට වඩා වැඩියෙන් කිරීමට සිදු වී තිබුණි. මෙම කාර්යය සඳහා ESR අනුමැතිය ලැබී නොතිබුණි. තවද, සැලසුම් කළ ආකාරයට ගොඩනැගිල්ල ඉදිනොකර වෙනස්කම් සිදුකිරීමෙන් මෙම ගොඩනැගිල්ල භාවිතා කළ හැකි අයුරින් සම්පූර්ණ කර නොතිබුණි.

මෙම මිල ගණන් ප්‍රතිශතවල සැසඳීම්වල Item No.24 හැර අනෙකුත් ඒවායේ විශාල මිල විචලනයන් දක්නට නොවීය. 2017 වර්ෂයේදී සිදු කළ මෙම ඇස්තමේන්තුව Item No.24 හි රු.57 ලෙස මිල සඳහන් කර තිබුණි. එසේ වුවත්, 2017 වර්ෂයේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් අනුමත කළ මිල ප්‍රකාශයේ රු.114 ක් ලෙස සඳහන් කර තිබුණි. එබැවින්, කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කළ මිල රු.125.00 වීම මගින් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමත කළ මිල ප්‍රකාශය සමඟ සැසඳීමේදී සෑහීමට පත් වූ නිසා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළිගෙන තිබුණි. පළාත් පාලන ආයතන මිල සමීක්ෂණය මේ සමඟ අමුණා ඇත.

| | | |
|---|---|---|
| (ii) | රු.427,775 ක් වටිනා කාර්යයන් විගණන දිනය වන 2019 මැයි 21 දින වන විටත් සම්පූර්ණයෙන්ම සිදු කර නොතිබුණි. | ඉහත සඳහන් කළ කාරණා හිලව් කිරීම සඳහා රු.427,775 ක් වටිනා දැනට අත්‍යවශ්‍ය නොවන කාර්යයන් ඉවත් කර තිබුණි. එසේ වුවත්, අදියර 2 ඉදිකිරීම් කාර්යයන් සම්පූර්ණයෙන් නිම කළ හැකිය. එසේම ඒ සඳහා වන ඇස්තමේන්තු වාර්තාවද, පළාත් අධ්‍යක්ෂ, ක්‍රීඩා දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත් ඉල්ලීමට අනුව යවා ඇත. |